



ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

காணிசீர்திருத்தஆணைக்குழு

Land Reform Commission

ඉඩම් අමාත්‍යාංශය

காணிஅமைச்சு

Ministry Of Lands

වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය

ஆண்டுறிக்ஜகமற்றும் குணக்குறிக்ஜக

Annual Performance Report

2019

වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය
2019

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

අංක 475

කඩුවෙල පාර

බත්තරමුල්ල

ශ්‍රී ලංකාව

දූරකථන: 0113520162

ෆැක්ස්: 0112878052

විද්‍යුත් තැපෑල: chairman@lrc.gov.lk

වෙබ්: www.lrc.gov.lk



සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ සංවර්ධන අරමුණු හා ඉලක්ක ප්‍රශස්ත අයුරින් සාක්ෂාත් කරගැනීමට ඉවහල් වන ප්‍රබලතම සම්පත වන ඉඩම් සම්පත සුළුතරයක් විසින් භුක්ති විඳීම වෙනුවට මෙරටේ සැබෑම උරුමකරුවන් වන මහජනතාව වෙත පත්කිරීමේ අරමුණින් දිවංගත හෙක්ටර් කොඩ්බෑකඩුව මැතිතුමන් විසින් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවන ලදි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා දශක 05කට ආසන්න වන මේ අවස්ථාවේ තවදුරටත් නීතිමය බැඳීම් අවසන් කිරීම, ඉඩම්වල පදිංචිව සිටින ජනතාවට ඔප්පු ලබාදීම, පූජනීය ස්ථාන වලට ඔප්පු ලබා දීම, රාජ්‍ය ආයතන විසින් බුක්ති විඳින ඉඩම් නියමානුකූල කිරීම මෙන්ම පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රැකී රක්ෂා ප්‍රවර්ධනය කිරීම සහ රාජ්‍ය ආදායම් උත්පාදනය තුළින් දේශීය කෘෂි ආර්ථිකය ගොඩනැගීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ඵලදායිව යොදා ගැනීම මෙන්ම නීති විරෝධී ක්‍රම වලින් බැහැර කර ඇති ඉඩම් හඳුනාගෙන ඒවා නැවත පනතේ අරමුණු ඉෂ්ඨ කර ගැනීම සඳහා යොදවා ගැනීම තවදුරටත් කල යුතුව ඇත.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යය ඉටු කිරීම සඳහා ගරු ඉඩම් අමාත්‍ය එස්.එම් චන්ද්‍රසේන මැතිතුමාගේ උපදෙස් මත කඩිනමින් ඉහත ගැටළුවලට අවශ්‍ය විසඳුම් ලබා දීමට අවශ්‍ය සැලසුම් මේ වන විටත් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී.

ඒ අනුව, 2019 වර්ෂයට අදාළ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.

නීතීඥ නිලන්ත විජේසිංහ
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

පටුන

1.	දළ විශ්ලේෂණය	1
	1.1 හැදින්වීම	1
	1.2 දැක්ම මෙහෙවර සහ අරමුණු	2
	1.2.1 දැක්ම	2
	1.2.2 මෙහෙවර	2
	1.2.3 අරමුණු	2
	1.3 කාර්යභාරය සහ සංවිධාන සැලැස්ම	3
	1.3.1 කාර්යයන්	3
	1.3.2 සංවිධාන සැලැස්ම	5
	1.4 අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල	6
	1.4.1 ප්‍රධාන අංශයන්	6
	1.4.2 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල	6
2.	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	6
	2.1 ආයතන ස්ථාපනය	6
	2.2 කොමිෂන් සභාවේ සංයුතිය	6
	2.3 නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්	6
3.	ආංශික ප්‍රගතිය	7
	3.1 කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන අංශය	7
	3.1.1 කාර්යය මණ්ඩල සංයුතිය	7
	3.1.2 ආයතනික කටයුතු	8
	3.1.3 භෞතික සම්පත් කළමනාකරණය	9
	3.2 ඉඩම් අංශය	10
	3.2.1 ඉඩම් පැවරීම් අංශය	10
	3.2.2 ඉඩම් උපරිම සීමා අංශය	10
	3.3.3 තක්සේරු හා චන්දි අංශය	10
	3.3 නීති අංශය	11
	3.3 නීති අංශයේ කාර්යභාරය	11
	3.4 මුදල් අංශය	12
	3.4.1 ගිණුම්කරන ප්‍රතිපත්ති හඳුන්වා දීම.	12
	3.4.1.1 ආයතනික තොරතුරු	12
	3.4.1.2 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති	13
	3.4.2 අවසන් මූල්‍ය වාර්තා	17
	3.5 අභ්‍යන්තර විගණක අංශය	21
	3.5.1 විගණනය සඳහා බලය	21
	3.5.2 වසර තුල ඉටු කරන ලද රාජකාරී	21
	3.6 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩල	22
	ඇමුණුම	**23**

A .ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2019.12.31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

1. දළ විශ්ලේෂණය

1.1 හැඳින්වීම

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ස්ථාපිත වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාවට 1972 දක්වා විහිදී යන ඉතිහාසයක් ඇත.

අවුරුදු 44 ක් පුරා කොමිපත් සභාවේ කාර්යභාරය ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ලැබී තිබූ ප්‍රතිපාදන මෙන්ම රජය විසින් වරින්වර ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් මත මෙහෙය වන ලදී. ඉඩම් හිමියන්ගේ නීතිමය බැඳීම් ලබාදීම මෙන්ම ඔවුනට වන්දි මුදල් ගෙවීම පවරාගත් ඉඩම් ඵලදායී ආයෝජන වලට යෙදවීම කොමිපත් සභාවට ලැබිය යුතු ආදායම රැස් කිරීම හා ඉඩම් ආරක්ෂා කිරීම සේවක මණ්ඩල පුහුණුව සහ සුභසාධනය ප්‍රධාන ප්‍රමුඛතාවයන් වේ.

වර්තමාන ශ්‍රී ලංකාවේ පෙරළිකාර දේශපාලන ගමන් මග සාර්ථක කරමින් රජයේ අරමුණු හා ප්‍රතිපත්තිවලට අනුව ඉඩම් කැබලි වැඩි ප්‍රමාණයක් මහජනයා අතරේ බෙදාදීමේ වැඩපිළිවල යටතේ එකී කටයුතු සාර්ථක කර ගැනීම ඉලක්ක කර ගනිමින් කොමිපත් සභාවේ කටයුතු මෙහෙයවීමට කටයුතු සම්පාදනය කර ඇත.

තවද මෙම වසර තුළ ආයතනයේ සේවක සේවිකාවන්ගේ රැකියා සුරක්ෂිතතාවයක් ඇති කරමින් නව ජීවයක් ලබාදීමේ වැඩසටහනක් දියත් කිරීම ආරම්භ කිරීමටද කටයුතු සම්පාදනය වෙමින් පවතී.

2019 වසර තුළ පහත සඳහන් ප්‍රමුඛතාවයන් විශේෂයෙන්ම හඳුනා ගැනීමට කටයුතු කර ඇත.

i. කොමිපත් සභාව සතු හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම.

ii. ඵලදායී නොවන ආයෝජන වලට පවරන ලද ඉඩම් ආපසු ලබා ගැනීම.

iii. ඉඩම් කැබලි ලක්ෂයක් බෙදාදීමේ වැඩපිළිවෙළ යටතේ කොමිපත් සභාව සතු බෙදාදිය හැකි ඉඩම් බෙදාදීමට කඩිනම් වැඩපිළිවෙළක් සකස් කිරීම මෙන්ම මෙතෙක් බෙදා නිබූ ඉඩම් සඳහා පදිංචිකරුවන් නියමානුකූල කර තිබූ වැඩසටහනට නව මුහුණුවරක් දී ජාතික කර්තව්‍යයක් ලෙස ඉඩම් ඔප්පු බෙදාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කරවීම.

iv. ආදායම් වැඩිකිරීමේ වැඩසටහන්

a) රණවිරු සේවා අධිකාරිය
b) රජය විසින් අත්කර ගත් ඉඩම් සඳහා වන්දි මුදල් ලබා ගැනීම
c) රාජ්‍ය ආයතන වලට පවරන ලද ඉඩම් වෙනුවෙන් ආදායම් ලබා ගැනීම
d) බදු පදනම මත පුද්ගලයන්ට පවරන ලද ඉඩම් සඳහා මෙතෙක් අයකර ගැනීමට නොහැකි වූ බදු මුදල් අයකර ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම
e) කලුගල් බදුදීම හා ඊට අදාල ආදායම් රැස්කිරීම
f) මැණික් ඉඩම් වලට අදාලව නව රෙගුලාසි පනවා ආදායම් රැස් කිරීම
g) සිලිකා, ඩොලමයිට්, වැලි ආදී ඛනිජ ද්‍රව්‍ය ඇති ඉඩම් වලින් ආදායම් ලබා ගැනීම

ආයතනයේ මෙම කාර්යභාරය පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා නිලධාරීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා ආයතනයේ සියලුම නිලධාරීන්ගෙන් සමන්විත එක් එක් කාර්යයන් සඳහා කමිටු පත්කිරීම හා වැඩමුලු පැවැත්වීමද ආරම්භ කරන ලදී. එමෙන්ම කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන්ද පවත්වන ලදී.

රජයේ ප්‍රතිපත්ති වලට අදාලව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාවේ කාර්යභාරය මෙහෙයවීමට හා කඩිනමින් ක්‍රියාත්මක කරවීම ඉතා කාලෝචිත පියවරක් ලෙස සලකා

නිරතුරුවම සාකච්ඡා පවත්වා අවශ්‍ය තිරණ හා එකි තිරණ ක්‍රියාත්මක කිරීමෙන් පසු පසුවිපරම් කිරීමද සිදුව ඇත. තවද මහජනයාගේ විවිධ ගැටලු සම්බන්ධයෙන් ඔවුන් කැඳවා පත්කල කමිටු මගින් සෘජු සාකච්ඡාවක් පවත්වා කඩිනම් තිරණ ගැනිමද සිදු වී ඇත.

මීට අමතරව ඵලදායි ආයෝජන හඳුනාගෙන ඒ සඳහා ඉඩම් ලබාදීමට ගරු ඇමතිතුමාගේ උපදෙස් මත විශේෂඥ දැනුම් ඇති උපදේශක කමිටුවේ නිර්දේශය මත ක්‍රියා කිරීම ආරම්භ කිරීමටද කටයුතු කර ඇත.

තවද, ගරු ඉඩම් අමාත්‍යතුමන්ගේ සහ අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ කඩිනම් මෙහෙයවීම උපදෙස් සහ මගපෙන්වීම මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාව වෙතින් පවරා ගත් ඉඩම් අතුරෙන් ගිලිහි ගොස් ඇති සම්පත්වලින් ආයතනයේ ප්‍රගතිය පමණක් නොව රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීමටද කටයුතු කර ඇත.

1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1 දැක්ම

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පැවරුණු ඉඩම් සහ භෞතික සම්පත් ජනතාවගේ සහ දේශයේ සමෘද්ධිය උදෙසා මෙහෙයවීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්කිරීම.

1.2.2 මෙහෙවර

ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ උපරිමයට වැඩි ඉඩම් ජාතියේ යහපත උදෙසා ඵලදායිතාවය ඉහළ නංවමින්ද භෞතික සම්පතෙහි අයිතිය සුරක්ෂිත කොට පාලනය කරමින්ද, ඉඩම් උපරිමය කාලානුරූපව බලාත්මක කරමින්ද, නියමානුකූලව වන්දි ගෙවීම හා ආර්ථික කටයුතුවල ආයෝජනය කරමින්ද, අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා භාවිතා කළ හැකි ඉඩම් සංචිතයක් පවත්වාගෙන යමින් ජාතික සංවර්ධනයට ක්‍රියාකාරී ලෙස දායකවීම.

1.2.3 අරමුණු

i. ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශි කිරීම.
   a) ප්‍රකාශිත එහෙත් හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනිම
   b) මහජනතාව වෙතින් ලැබෙන තොරතුරු අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාව සතු ඉඩම් හඳුනා ගැනිම
   c) පැවරීම් කළද එම කාර්යය ඉටු නොවන්නේ නම් එම ඉඩම් කොමිපත් සභාව සතු කර ගැනිම

ii. කොමිපත් සභාව වෙත පැවරුණු ඉඩම් පිළිබඳ,
   a) ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නිශ්චය හා නිතිමය බැදීම් නිදහස් කිරීම
   b) උපරිමයට වැඩි ඉඩම් කොමිපත් සභාව වෙත පවරා ගැනිම
   c) පවරාගත් ඉඩම් සඳහා වන්දි මුදල් ගෙවීම
   d) ප්‍රකාශ කරන ලද එහෙත් ප්‍රකාශ නොවන අයගේ ඉඩම් ආපසු ලබාදීම යන කාර්යයන් කිරීම

iii. රටේ ආර්ථිකය සමාජ සංවර්ධනය උදෙසා රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තිරණ හා පනතේ ප්‍රතිපාදන අනුව පවරා ගනු ලැබූ ඉඩම් ඵලදායි ලෙස ආයෝජන කාර්යයන්හි යෙදවීම

iv. කොමිපත් සභාව සතු ඉඩම් වලින් ලැබිය යුතු ආදායම් රැස් කිරීම හා එයින් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායකත්වය ලබාදීම

1.3 කාර්යභාරය සහ සංවිධාන සැලැස්ම

1.3.1 කාර්යයන්

i. ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධානයන්ට අනුව පුද්ගලයකුට තබා ගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය නිත්‍යනුකූල කිරීම.

ii. උපරිමයට වැඩි ඉඩම් හඳුනාගෙන කොමිපත් සභාව සතු කර ගැනීම.

iii. පනත්වලින් ලැබී ඇති ප්‍රතිපාදන අනුව නිතිමය බැඳීම් නිදහස් කිරීම.

iv. කොමිපත් සභාව සතු කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් ප්‍රකාශකයින්ට වන්දි මුදල් ගෙවීම.

v. පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබාදීමට කටයුතු කිරීම.

vi. ඉඩම් ලේඛණ යාවත්කාලීන කරමින් ක්ෂේත්‍රය හා සම්බන්ධ වී ඉඩම් පිලිබඳ තොරතුරු ඒකරාශි කිරීම.

a) ප්‍රකාශ කර ඇති නමුත් හඳුනාගෙන නොමැති ඉඩම්

b) උපරිමයට වැඩි ප්‍රකාශ නොකරන ලද ඉඩම්

c) පවරා දී ඇති නමුත් ඵලදායී ආයෝජනයක් නොකරන ලද ඉඩම්

vii. රටේ ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීම.

a) ආයෝජන මණ්ඩලය අනුමත ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම

b) කෘෂිකාර්මික ව්‍යාපෘති සහ වගා කටයුතු සඳහා ඉඩම් ලබාදීම.

c) කර්මාන්ත සඳහා ඉඩම් ලබාදීම.

viii. රටේ සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීම.

a) ඉඩම් නොමැති ජනතාවට නිවාස අරමුණු සඳහා ඉඩම් ලබාදීම.

b) රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත ගනු ලබන විශේෂ ව්‍යාපෘති සඳහා ඉඩම්

ලබාදීම.

c) ආගමික සිද්ධස්ථාන සඳහා ඉඩම් ලබාදීම

d) ජනතාව වෙනුවෙන් පොදු කටයුතු සඳහා ඉඩම් ලබාදීම.

e) රාජ්‍ය ආයතන වෙනුවෙන් ඉඩම් ලබාදීම.

ix. ආදායම් රැස්කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

a) භූමියේ ඇති සම්පත් වලින් ආදායම් රැස් කිරීම

b) බදු පදනම මත ඉඩම් පැවරුම් කර බදු ආදායම් රැස් කිරීම.

c) රාජ්‍ය, රාජ්‍ය නොවන හා පුද්ගලයින්ගේ ලැබිය යුතු මුදල් අය කර ගැනීම.

x. ආයතනයේ සංවිධාන ව්‍යුහය ව්‍යුහගත කිරීම.

a) පුහුණු හා කාර්යසාධන කාර්ය මණ්ඩලයක් ඇති කරලීම

b) විධිමත් රාජකාරි පැවරුමක් කිරීම

c) බලතල විමධ්‍යගත කරමින් රාජකාරි පැවරුමක් කිරීම

d) සාකච්ඡා, වැඩමුළු, පුහුණුවීම් සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම.

xi. ආයතනයේ කාර්යසාධන ඵලදායිතාවයක් ඇති කරලීමට භෞතික සම්පත් සම්පාදනය හා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

1.3.2 සංවිධාන සැලැස්ම



1.4 අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

1.4.1 ප්‍රධාන අංශයයන්

i. කළමණාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය
ii. ඉඩම් අංශය
iii. මුදල් අංශය
iv. නීති අංශය

1.4.2 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

ඉඩම් ප්‍රතිසංස්ක්‍රණ කොමිපත් සභාව දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කාර්‍යාල 20කින් සමන්විත වේ.

2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාව

2.1 ආයතනය ස්ථාපනය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභා පනත මගින් පිහිටුවා ඇත.

2.2 කොමිපත් සභාවේ සංයුතිය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාවේ සංයුතිය මෙසේය.

i. ගරු විපය හාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන - සභාපති
ii. ගරු විපය හාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් -05
iii. නිල බලයෙන් පත්වන සාමාජිකයින් -03

කොමිපත් සභාවේ කාර්යයන් ක්‍රියාවට නැංවීමේහිලා උපයෝගි කරගනු ලබනුයේ මෙම කොමිපත් සභා මණ්ඩලය මගින් ගනු ලබන තීරණ හා අනුමැතියන් වන අතර, එක් එක් කාර්යයට කොමිපත් සභා මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු ලැබේ. 1972 වර්ෂයේ සිට 2019.12.31 දින දක්වා කොමිපත් සභා මණ්ඩල රැස්වීම් 732 ක් පවත්වා ඇත.

2.3 නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්

i. 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත
ii. 1975 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iii. 1981 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iv. 1981 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
v. 1986 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
vi. 1986 අංක 18 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනත

අංක (i) හා (ii) පනත් අනුව, දේශීය ප්‍රකාශකයින්ගෙන්, රන් පවුම් සමාගම්වලින් හා රූපියල් සමාගම්වලින් ඉඩම් අක්කර 1,048,208 රූඩ් 2 පර්. 01 ක් ඉඩම් ප්‍රතිසංසක්‍රණ කොමිපත් සභාව වෙත පැවරී ඇත. ඉහත අංක (i) හා (ii) පනත් සම්බන්ධව,

i. සංශෝධනයන් - අංක iii හා vi පනත් වලින්ද
ii. විධිවිධානයන් - අංක iv. v හා vi පනත් වලින්ද සලසා ඇත.

3. ආංශික ප්‍රගතිය

3.1 කළමණාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

3.1.1 කාර්ය මණ්ඩල සංයුතිය

වගුව 3.1: 2019 වර්ෂයේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු

අනු අංකය	තනතුරු නාමය	අනුමත තනතුර සංඛ්‍යාව	ප්‍රවර්තන වර්ෂයේ සිටි සංඛ්‍යාව (2019)	අතිරික්තය / ඌණතාවය
1.	අධ්‍යක්ෂ ජනරාල්	01	01	-
2.	ලේකම් /අධ්‍යක්ෂ (පාලන)	01	01	-
3.	අධ්‍යක්ෂ (මූදල්)	01	01	-
4.	අධ්‍යක්ෂ (ඉඩම්)	01	01	-
5.	අධ්‍යක්ෂ (නීති)	01	01	-
6.	අධ්‍යක්පක (ආරක්පක හා විමර්පණ)	-	01	01
7.	අභ්‍යන්තර විගණක	01	01	-
8.	සහකාර අධ්‍යක්ෂ (පාලන)	01	01	01
9.	සහකාර අධ්‍යක්ෂ (මූදල්)	02	02	-
10.	සහකාර අධ්‍යක්ෂ (නීති)	03	06	03
11.	සහකාර අධ්‍යක්ෂ (විමර්ශන)	01	01	-
12.	සහකාර අධ්‍යක්ෂ (කලාප)	20	10	(10)
13.	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති)	01	02	01
14.	සහකාර අධ්‍යක්ෂ (ඉඩම් උපරිම සීමා)	01	01	-
15.	සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පැවරීම්)	01	04	02
16.	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තක්සේරු හා වන්දි)	01	01	-
17.	සහකාර අධ්‍යක්ෂ (මැණුම්)	01	02	-
18.	ගිණුම් නිලධාරී	01	-	01
19.	පරිපාලන නිලධාරී	01	01	-
20.	තොරතුරු තාක්ෂණ නිලධාරී	01	01	-
21.	පුද්ගලික සහකාර	01(පුද්ගලික වන සේ)	01	-
22.	තක්සේරු නිලධාරී	03	-	(03)
23.	මාණ්ඩලික සහකාර	23(පුද්ගලික වන සේ)	19	-
24.	ගිණුම් නිලධාරී	05(පුද්ගලික වන සේ)	04	-
25.	සැලසුම් ශිල්පී	02	-	(02)
26.	ප්‍රවාහන සහකාර	01	01	-
27.	කළමනාකරණ සහකාර	215	346	131
		40 (පුද්ගලික වන සේ)		-
28.	රියදුරු	17	27	10
29.	කාර්යාල සහායක	44	62	18
	එකතුව	**392**	**499**	

3.1.2 ආයතනික කටයුතු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාවේ 2018 වර්ෂය හා සසඳමින් මෙම වර්ෂයේ ආයතනික කටයුතු කාර්යසාධනය 3.2 වගුව මගින් ඉදිරිපත්කොට ඇත.

වගුව 3.2: 2019 වර්ෂයේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු

අනු අංකය	විස්තර	පෙර වර්ෂය (2018)			ප්‍රවර්තන වර්ෂය (2019)		
		ඉල්ලීම් සංඛ්‍යාව	අනුමත කළ සංඛ්‍යාව	ඉතිරි සංඛ්‍යාව	ඉල්ලීම් සංඛ්‍යාව	අනුමත කළ සංඛ්‍යාව	ඉතිරි සංඛ්‍යාව
1.	සේවයට බඳවා ගැනීම්	63	63	-	47	47	-
2.	විභාග පැවැත්වීම්	-	-	-	-	-	-
3.	සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම්	03	03	-	-	-	-
4.	සේවය ස්ථීර කිරීම්	03	03	-	168	168	-
5.	උසස් කිරීම්	03	03	-	-	-	-
6.	වැටුප් වර්ධක ගෙවීම්	307	304	03	309	305	04
7.	සේවය දීර්ඝ කිරීම්	02	02	-	01	01	-
8.	බඳවා ගැනීමේ පරිපාටි සැකසීම	-	-	-	-	-	-
9.	සේවය හැර යෑම්	02	02	-	03	03	-
10.	වැඩ තහනම් කිරීම්	02	02	-	03	03	-
11.	නැවත සේවයේ පිහිටුවීම්	-	-	-	-	-	-
12.	විනය පරීක්ෂණ	06	06	-	02	-	-
13.	විදේශ නිවාඩු අනුමත කිරීම්	02	02	-	05	05	-
14.	පුනුණු කිරීම්	02	02	-	13	13	-
15.	අමාත්‍ය මණ්ඩල සංදේශ	-	-	-	-	-	-
16.	ඇප ආරම්භ කිරීම්	-	-	-	-	-	-
17.	ඇප නිදහස් කිරීම්	06	06	-	-	-	-
18.	ණය අනුමත කිරීම I. දේපල II. වාහන III. වෙනත්	 - 15 85	 - 10 71	 - 05 14	 - 09 113	 - 09 113	 - - -

3.1.3 භෞතික සම්පත් කළමනාකරණය

3.3 වගුව මගින් 2019 වර්ෂයේ කොමිපත් සභාව වෙත භෞතික සම්පත් අත්පත් කරගැනීම සහ බැහැර කිරීම පිළිබඳ තොරතුරු දක්වා ඇත.

වගුව 3.3 : භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු

අනු අංකය	වත්කම් වර්ගය	වසර ආරම්භයේ පැවති තත්වය	වර්ෂය තුළ සිදු වූ වෙනස්කම්		වසර අවසානයේ පැවති තත්වය
			විකිණීම්	මිලදී ගැනීම්	
1.	කැබ් රථ	12	-	-	12
2.	මෝටර් රථ	02	-	-	02
3.	මයික්‍රෝ කයිරන් ජීප් රථ	01	-	-	01
4.	වෑන්	01	-	-	01
5.	මුදල් නෝට්ටු ගණනය කිරීමේ යන්ත්‍ර	01	-	-	01
6.	ඩුප්ලෝ යන්ත්‍ර	01	-	-	01
7.	ඡායා පිටපත් යන්ත්‍ර	14	-	-	15
8.	පරිගණක	88	-	01	117
9.	පරිගණක ප්‍රින්ටර්ස්	31	-	18	49
10.	ලැප්ටොප් පරිගණක	06	-	-	06
11.	ෆැක්ස් යන්ත්‍ර	20	-	01	21
12.	යතුරු ලියන	03	02	-	01
13.	සේප්පු	10	-	-	10
14.	කැමරා	01	-	-	01
15.	රූපවාහිනී යන්ත්‍ර	02	-	05	07
16.	ශීතකරණ	01	-	03	04
17.	ශබ්ද විකාශන යන්ත්‍ර	02	01	-	01

3.3 ඉඩම් අංශය

3.3.1 ඉඩම් පැවරීම් අංශය

3.4 වගුව මගින් 2019 වර්ෂයේ ඉඩම් පැවරීම් අංශයේ කාර්යසාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 3.4: 2019 වර්ෂයේ ඉඩම් පැවරීම් අංශයේ කාර්යසාධනය

අනු අංකය	ව්‍යාපෘති	වාර්ෂික ඉලක්කය	නිම කළ සංඛ්‍යාව
1.	අනුමත කෘෂිකාර්මික හෝ කාර්මික සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දීම (ව්‍යාපෘති කමිටු වෙත ඉදිරිපත් කිරීම)	98	62
2.	නිවාස අරමුණු හා ජීවනෝපාය සලසා ගැනීමේ අවශ්‍යතාවය මත ඉඩම් විකිණීම් හා බදුදීම්	-	3114
3.	පොදු කටයුතු සඳහා ඉඩම් විකිණීම්	15	06
4.	ධැව සම්පත් ආශ්‍රිත ආර්ථික උපයෝජන :ව්‍යාපෘති ටෙන්ඩර් මගින් විකිණීම)	-	63
5.	ඛණිජ සම්පත් ආශ්‍රිත ආර්ථික ව්‍යාපෘති (වැලි. කළු ගල්. සිලිකා. මැණික්. ඩොලමයිට්)	65	64

3.3.2 ඉඩම් උපරිම සීමා අංශය

3.5 වගුව මගින් 2019 වර්ෂයේ ඉඩම් උපරිම සීමා අංශයේ කාර්යසාධනය පෙනුම් කරනු ලබයි.

වගුව 3.5: 2019 වර්ෂයේ ඉඩම් උපරිම සීමා අංශයේ කාර්යසාධනය

අනු අංකය	විස්තරය	ඉලක්කය	නිම වූ සංඛ්‍යාව
1.	19 වන වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ඉඩම් ලබාදීම	72	01
2.	14 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම	24	07
3.	22 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම	24	05
4.	ප්‍රකාශ නොවන අයගේ ඉඩම් නිදහස් කිරීම	12	02

3.3.3 තක්සේරු සහ වන්දි අංශය

3.6 වගුව මගින් 2019 වර්ෂයේ තක්සේරු සහ වන්දි අංශයේ කාර්යසාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 3.6: 2019 වර්ෂයේ තක්සේරු සහ වන්දි අංශයේ කාර්යසාධනය

අනු අංකය	විස්තරය	ප්‍රකාශකයින් ගණන	ගෙවූ මුදල (රුම්ලියන)
01.	වන්දි ගෙවීම / පොළී ගෙවීම	19	8.61
02.	ඉඩම් විකිණීම් හා බදු දීම් සඳහා තක්සේරු කැඳවීම	130	-
03.	ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු කැඳවා වාර්තා කිරීම	636	2938.32

3.4 නීති අංශය

3.7 වගුව මගින් 2019 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව විසින් මෙහෙයවනු ලැබූ නඩු කටයුතු පිළබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබයි.

වගුව 3.7: 2019 වර්ෂයේ නඩු කටයුතු පිළිබඳ සංඛ්‍යා දත්ත

අනු අංකය	විස්තරය	2018.12.31 දිනට පවතින නඩු	2019 වර්ෂය තුල පවරන ලද නඩු සංඛ්‍යාව2019	වර්ෂය තුළ නිම වූ සමතයට පත් වූ නඩු	2019.12.31 දිනට පැවැති නඩු සංඛ්‍යාව
1.	ශ්‍රේෂ්ඨාධිකරණය	39	15	14	40
2.	අභියාචනාධිකරණය	47	15	21	41
3.	මහාධිකරණය	14	18	13	19
4.	දිසා අධිකරණය	443	101	110	434
5.	මහේස්ත්‍රාත් අධිකරණය	231	145	66	310
6.	කම්කරු විනිශ්චය සභාව	05	-	03	02
7.	මානව හිමිකම් කොමිසන් සභා	19	07	14	12
8.	සිවිල් අභියාචන මහාධිකරණය	34	18	26	26
	එකතුව	832	319	267	884

3.4 මූල්‍ය අංශය

3.4.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම

3.4.1.1 ආයතනික තොරතුරු

1972 අංක **01** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව **(LRC)** පිහිටුවන ලදී.

සීමාව ඉක්මවා ඇති ඕනෑම පුද්ගලයෙකුට අයත් කෘෂිකාර්මික ඉඩම් පවරා ගැනීම සහ එම ඉඩම එහි ඵලදායිතාවයේ සහ එම ඉඩමෙන් උත්පාදනය වන රැකියා නියුක්තිය ඉහළ නැංවීමට හේතු වන ආකාරයට භාවිතා කිරීම.

2015 ජූනි 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/3/02015 අනුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙනත් රාජ්‍ය සතු ව්‍යවසායන්හි "C" උප කාණ්ඩයේ "C" යටතේ වර්ගීකරණය කර ඇත.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරිත්වයේ ස්වභාවය

කොමිෂන් සභාවේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ ඉඩම් හිමියන්ගේ ව්‍යවස්ථාපිත බැඳීම් නිදහස් කිරීම සහ ඔවුන්ට වන්දි ගෙවීම, ඵලදායී ආයෝජන සඳහා පවරා ඇති ඉඩම් පරිහරණය කිරීම සහ කොමිෂන් සභාවේ ආදායම් එකතු කිරීම, ඉඩම් ආරක්ෂා කිරීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ සුබසාධනය ය.

2019 වසර අවසානයේ කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව **493** කි.

නිකුත් කිරීම සඳහා අවසර දුන් දිනය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් **2020** පෙබරවාරි **27** වැනි දින අවසර දෙන ලදී.

අඛණ්ඩ පැවැත්වීමේ පදනම

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්වීමේ පදනම මත සකස් කර ඇත.

මූල්‍ය වර්ෂය

කොමිෂන් සභාවේ මූල්‍ය වර්ෂය **2019** ජනවාරි **01** සිට **2019** දෙසැම්බර් **31** දක්වා මාස දොළහක කාලයක් නියෝජනය කරයි.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

අනුකූලතා ප්‍රකාශය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ (LRC) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS 1 සිට 20 දක්වා) අනුව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් SLPSAS 1 අදාළව ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ වන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩව යෙදී ඇත.

මිනුම් පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය හෙළිදරව් කිරීම් සිදු කරන අවස්ථා හැර
මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කර ඇත.

සංසන්දනාත්මක තොරතුරු

වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා සහ සංසන්දනාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියලුම මුදල් ප්‍රමාණයන් සඳහා ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළත් සංසන්දනාත්මක තොරතුරු පෙර කාල සීමාව සම්බන්ධයෙන් අනාවරණය කරනු ලැබේ. අවශ්‍ය වූ විට, සංසන්දනාත්මක සංඛ්‍යා වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුරූප වන පරිදි නැවත සකස් කර ඇත.

ද්‍රව්‍යමය හා එකතු කිරීම

සමාන අයිතමවල සෑම ද්‍රව්‍යමය පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ශ්‍රිතයක අයිතමයන් ද්‍රව්‍යමය නොවන ඒවා නම්, ඒවා වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාව ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරය තුළ කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ.

3.4.1.2 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

දේපල, පිරියත සහ උපකරණ

SLPSAS -07 අනුව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති කොමිෂන් සභාවේ දේපල, පිරියත සහ උපකරණ. ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2018 දෙසැම්බර් 31 දිනට 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති ඉඩම් හැර කොමිෂන් සභාවේ දේපල, පිරියත සහ උපකරණ නැවත තක්සේරු කර ඇතත්, මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන තෙක් කොමිෂන් සභාවට සියලුම භෞතික ස්ථාන තක්සේරු වාර්තා ලැබී නැත. එබැවින් 2019 මූල්‍ය ප්‍රකාශන දේපල, පිරියත සහ උපකරණ ඓතිහාසික පිරිවැය පදනමින් සඳහන් කර ඇත. කොමිෂන් සභාවට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සියලුම තක්සේරු වාර්තා ලැබුණු පසු අවශ්‍ය ගැලපීම් සිදු කර ඒ අනුව අදාළ නිලධාරීන් වෙත යොමු කරනු ඇත.

හඳුනාගැනීමේ සහ මැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගලා ඒමට සම්භාවිතාවක් තිබේ නම්, දේපල, පිරියත සහ උපකරණ හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය. සියලුම දේපොළ, කම්හල් සහ උපකරණ සහ යම් යම් හානි පාඩු මුලින් පිරිවැයෙන් ප්‍රකාශ කරනු ලබන අතර පසුව පිරිවැය අඩු සමුච්චිත ක්ෂයවීම් වලින් මනිනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණවල අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීමේ පිරිවැය දුර්වලතා සඳහා සමාලෝචනය කරනු ලබන්නේ සිදුවීම් හෝ තත්වයන් වෙනස් වන විට ඉදිරියට ගෙන යාමේ වටිනාකම ආපසු ලබාගත නොහැකි බවයි.

ක්ෂය වීම

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දේපල, පිරියත සහ උපකරණ ක්ෂයවීම් ප්‍රතිපත්තිය 2018 වර්ෂයේ සිට ශේෂය අඩු කිරීමේ ක්‍රමයේ සිට සරල රේඛීය ක්‍රමය දක්වා කොමිෂන් සභාවේ දේපල, පිරියත සහ උපකරණ නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලියෙන් පසුව වෙනස් කර ඇත. නව ක්ෂයවීම් ප්‍රතිපත්තියට අනුව අත්පත් කරගත් වත්කම් මිලදී ගත් දිනයේ දී අත්පත් කරගත් මුළු පිරිවැයෙන් අවසාන අගයෙන් 5% ක් අඩු කිරීමෙන් පසු ක්ෂය වේ. වත්කම්වල ඉතිරි වටිනාකම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය භාවිතා කිරීමෙන් එකවර වෙන් කරනු ලැබේ.

වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය සහ ක්ෂයවීම් අනුපාතය පහත පරිදි වේ.

වත්කම් වර්ගය	ක්ෂයවීම් අනුපාතය
ගොඩනැගිලි	5%
පරිගණක උපකරණ	20%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම	10%
මෝටර් රථ	10%
කාර්යාල උපකරණ	20%
පිරියත සහ යන්ත්‍රෝපකරණ	20%
සුබසාධන උපකරණ	20%
බයිසිකලය	20%

හඳුනා නොගැනීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. වත්කම් හඳුනාගැනීමෙන් ඉවත්වීමේදී ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ශුද්ධ ඉවතලන ආදායම සහ ඉදිරියට රැගෙන යන මුදල අතර වෙනස ලෙස ගණනය කරනු ලබන අතර වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කර ඇති අතර, වත්කම හඳුනා නොගනී.

ආයෝජන දේපල

1972 අංක **01** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති ඉඩම **SLPSAS -13** යටතේ ආයෝජන දේපළ ලෙස මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දක්වා ඇත. මක්නිසාද යත් දිගුකාලීන බදු දීමෙන් කොමිෂන් සභාවේ ආදායම් උත්පාදන ක්‍රියාවලිය සඳහා පවරා ඇති ඉඩම් භාවිතා කරනු ලැබේ.

තොග

කොමිෂන් සභාවේ තොග නිකුත් කර අගය කරන ලද පළමුව ඇතුලට පළමුව එළියට **(FIFO)** ක්‍රම **SLPSAS – 09** අනුව මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇත. වසර අවසානයේ තොගවල නවතම මිලදී ගැනීමේ පිරිවැය/මිල සඳහන් කර ඇත. කොමිෂන් සභාවේ තොගවලට විවිධ ආකාරයේ අයදුම්පත්, ලිපි ද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය ඇතුළත් වේ.

මූල්‍ය වත්කම් - මූලික හඳුනා ගැනීම සහ මැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය **39** හි විෂය පථය තුළ ඇති මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු, කල් පිරෙන ආයෝජන හරහා සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය වත්කම් ලෙස වර්ග කර ඇත. කොමිෂන් සභාව මුලදී ණය සහ ලැබිය යුතු මුදල් සහ තැන්පතු හඳුනා ගන්නේ ඒවා ආරම්භ වූ දිනයේය.

කොමිෂන් සභාවේ මූල්‍ය වත්කම්වලට ලැබිය යුතු මුදල්, ණය සහ කාර්ය මණ්ඩලයට අත්තිකාරම්, කල්පිරීමේ සිට කල් පිරෙන මූල්‍ය වත්කම් සහ මුදල් හා මුදල්වලට සමාන දෑ අඩංකුයි. මුලදී, ණය සහ ලැබිය යුතු ඒවා ආරම්භ වූ දිනයේ දී හඳුනා ගැනේ. ණය සහ ලැබිය යුතු මුදල් ඒවායේ පිරිවැය අනුව දක්වා ඇත. ණය සහ ලැබිය යුතු දේ වෙළඳ ලැබිය යුතු, සේවක ණය සහ අත්තිකාරම්, තැන්පතු සහ අනෙකුත් ලැබිය යුතු මුදල් වලින් සමන්විත වේ.

කල් පිරෙන මූල්‍ය වත්කම් (HTM)

රජයේ බැංකු සහ රජයේ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන සූරාකුම්පත්වල ස්ථාවර තැන්පතු සඳහා කෙටි කාලීන ආයෝජන සඳහා ලැබිය යුතු වන්දි ගෙවීම සහ පොලී සඳහා රක්ෂිතය **HTM** ආයෝජන යටතේ වර්ගීකරණය කර ඇත.

මුදල් සහ මුදල්වලට සමාන දෑ

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අතේ ඇති මුදල් වෙක්පත් ගිණුම් තුනක් සහ ඉතිරි කිරීමේ ගිණුම් දෙකක් සලකා බලයි, කොමිෂන් සභාවේ මුදල් කළමනාකරණයේ අනිවාර්ය අංගයක් සහිත බැංකු ශේෂයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ මුදල්වලට සමාන දෑ කොටස්වල අංගයක් ලෙස ඇතුළත් වේ. මුදල් සහ මුදල්වලට සමාන දෑ, අතේ ඇති මුදල්, බැංකුවේ මුදල්, බැංකුවේ තැන්පතු ඇතුළත් වේ.

වගකීම් සහ ප්‍රතිපාදන

වගකීමක් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ පියවීමට අපේක්ෂා කරන විට ධාරාව ලෙස වර්ග කෙරේ; මූලික වශයෙන් අද දින ක්‍රියාත්මක වන දිනය සඳහා පවත්වනු ලබන අතර, වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත පියවීමට හෝ වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහකට වගකීම් පියවීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැත. කොමිෂන් සභාව අනෙකුත් සියලුම වගකීම් වත්මන් නොවන ලෙස වර්ගීකරණය කරයි.

අවිනිශ්චිත වගකීම්

අනාගතයේදී කොමිෂන් සභාවට එරෙහිව අතීත සහ වර්තමාන නීතිමය ක්‍රියාමාර්ග සමඟ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඇස්තමේන්තු කර ඇති අතර, කොමිෂන් සභාව බාහිර පුද්ගලයන්ට රුපියල් මිලියන 650 ක් පමණ අවිනිශ්චිත වගකීමක් ලෙස ගෙවීමට ඇස්තමේන්තු කර ඇත. මූල්‍ය ප්‍රකාශන විධිවිධාන අදාළ බලධාරීන්ගෙන් අදාළ සියලුම ලිඛිත සාක්ෂි සහ තහවුරු කිරීම් ලැබුණු පසු විධිවිධාන සලසනු ඇත.

අවිනිශ්චිත වත්කම්

කොමිෂන් සභාව විසින් ගනු ලැබූ අතීත සහ වර්තමාන නීතිමය ක්‍රියාමාර්ග සමඟ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඇස්තමේන්තු කර ඇති අතරලෙ ඉදිරියේදී කොමිසමට බාහිර පුද්ගලයන්ගෙන් රුපියල් මිලියන 1,242 ක් පමණ ලැබෙනු ඇත. එසේමලෙ ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ කටයුතු කොමිෂන් සභාව හේතුවෙන් බාහිර පුද්ගලයන්ගෙන් රුපියල් මිලියන 310 ක් ලැබෙනු ඇත.

ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාවට නෛතික හෝ ව්‍යවස්ථාපිත බැඳීමක් ඇති විට, මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ. වගකීම පියවීම සඳහා වන්කම් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර වගකීම විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

සේවක ප්‍රතිලාභ

සේවක නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිතය

කොමිෂන් සභාවේ සේවකයන්ට, වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ අයට ඔහුගේ/ඇයගේ සේවා වසර ගණන අනුව වාර්ෂිකව අවසන් වරට ලබා ගත් වැටුප (මූලික වැටුප් සහ ජීවන වියදම් දීමනාව ඇතුළුව) ලැබීමට හිමිකම් ඇත. කොමිෂන් සභාවේ මෙම ප්‍රතිපත්තිය මත සිදු කරනු ලබන වාර්ෂික පාරිතෝෂිත ප්‍රතිපාදන වලදි. තවද, විශේෂ ඔප්පු උත්සව සඳහා වාර්ෂික අලුත් කිරීමේ පදනම මත වසර තුනක කොන්ත්‍රාත් කාලය සඳහා විශේෂ කැබිනට් අනුමැතිය යටතේ බඳවා ගත් සේවකයින් පාරිතෝෂිත ප්‍රතිපාදන සඳහා ඔවුන් ඇතුළත් කර නොතිබුණි.

නිශ්චිත දායක සැලසුම්- සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුකූලව, සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් සහ සේවක භාර අරමුදල් දායක මුදල් සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. මේවා විස්තිරණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස හඳුනාගෙන ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙළින් සේවකයන්ගේ ජීවන වියදම් සමඟ මූලික මුදලින් **15%** සහ **3%** දායක වේ.

බදුකරණය

ආදායම් බදු

2006 අංක **10** දරන දේශීය ආදායම් පනතේ **7 (b) (ii)** වගන්තිය යටතේ කෙටි කාලීන තැන්පතු සහ අරමුදල් කළමනාකරණයෙන් උපයන පොලිය හැර කොමිස් මුදලේ අතිරික්තය සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් වේ.

වෙනත් බදු

බදු ඉඩම් කුලිය සහ කොමිෂන් සභාවට ලැබුණු අනෙකුත් සේවා ගාස්තු සම්බන්ධයෙන් **VAT, NBT** සහ **WHAT** ගෙවා ඇත. එබැවින් වෙනත් බදු සඳහා ප්‍රතිපාදන සලසා නැත.

විලම්භීත බදු

2006 අංක **10** දරන දේශීය ආදායම් පනතේ **7 (ආ) (ii)** වගන්තිය යටතේ කොමිෂන් සභාවේ අතිරික්තය සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කර ඇති බැවින් කල් දැමූ බද්ද සඳහා ප්‍රතිපාදන සපයා නැත.

රජයේ ප්‍රදාන

මුලදී, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීමේ අදියර සඳහා ශ්‍රී ලංකා භාණ්ඩාගාරයට රුපියල් **15,000,000/-** මූලික ප්‍රදානයක් ලබා දෙන ලද අතර පසුව රජයේ අරමුදල් නොගෙන කොමිෂන් සභාව විසින්ම ජනනය කරන ලද අරමුදල් යොදා ගනිමින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලැබිය.

3.2.1 අවසන් ගිණුම් වාර්තා

වගුව 3.8: 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

විස්තරය	සටහන්	31.12.2019 රු.	31.12.2018 රු.
අදායම	14	267,958,119.62	277,409,525.15
වෙනත් මෙහෙයුම් ආදායම්	15	52,683,814.07	63,166,862.11
පරිපාලන වියදම්	16	(473,254,789.17)	(365,670,951.74)
සැපයුම් සහ අවශ්‍ය වියදම්	17	(14,765,509.34)	(17,182,793.28)
අනෙකුත් මෙහෙයුම් වියදම්	18	(33,161,841.26)	(17,951,772.71)
මෙහෙයුම් අතිරික්තය		**(200,540,206.08)**	**(60,229,130.47)**
මූල්‍ය ආදායම්	19	207,922,114.71	184,982,065.86
මූල්‍ය වියදම්	20	(6,090,781.90)	(3,117,689.33)
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය		**1,291,126.73**	**121,635,246.06**
2019.01.01 දිනට ආරම්භක ශුද්ධ අතිරික්තය		1,341,036,849.08	1,198,823,032.51
වෙනත් විස්තීරණ ආදායම්			
පෙර වර්ෂය සඳහා ගැලපීම්	21	(53,929,664.04)	20,578,570.51
2019.12.31දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීරණ අදායම		**1,288,398,311.77**	**1,341,036,849.08**

.....

එස්.පී.එස්.සේනානායක
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

එස්. පී. එස්. සේනානායක
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

.....

නීතිඥ නිලන්ත විජේසිංහ
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

නීතිඥ නිලන්ත විජේසිංහ (සාස්ත්‍රවේදී)
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල

.....

එච්.එම්.බී.පී.හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

වගුව 3.9: 2019.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

විස්තරය	සටහන්	2019.12.31 රු.	2018.12.31 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	3	107,869,015.55	49,176,072.40
ලිදුල බංගලාව			
ෆාම්ගාඩන් වත්ත			
දවුල් කුරුදු වත්ත			
මුළු ජංගම නොවන වත්කම්		**107,869,015.55**	49,176,072.40
1972 අංක 01 දරණ පනත යටතේ පවරන ලද ඉඩම්		**676,169,345.33**	**676,169,345.33**
ජංගම වත්කම්			
තොග - ලිපි ද්‍රව්‍ය	4	4,239,701.94	2,551,709.53
වෙලඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	5	2,458,255,257.17	2,401,278,675.06
ලැබිය යුතු පොලී	6	96,987,893.91	78,749,848.35
තැම්පතු හා අත්තිකාරම්	7	84,922,159.59	69,756,994.10
කෙටිකාලින බැංකු තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්	8	1,919,478,420.83	1,756,679,568.40
මුදල්, මුදල් හා සමාන දෑ	9	61,971,710.73	57,525,784.76
මුළු ජංගම වත්කම්		**4,625,855,144.17**	**4,366,542,580.20**
මුළු වත්කම්		**5,409,893,505.05**	**5,091,887,997.93**
වගකීම්			
සමුච්චිත අරමුදල් හා සංචිත			
සංචිත	10	1,460,694,465.39	1,344,492,737.86
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනන සංචිතය		57,066,562.87	
සමුච්චිත අතිරික්තය		1,288,398,311.77	1,341,036,849.08
මුළු සමුච්චිත අරමුදල් හා සංචිත		**2,806,159,340.03**	**2,685,529,586.94**
අරමුදල් සහ ප්‍රධාන			
රජයේදායකත්වය හා භාන්ඩාගාර ප්‍රධාන	11	1,964,075,000.00	1,964,075,000.00
මුළු අරමුදල් සහ ප්‍රධාන		**1,964,075,000.00**	**1,964,075,000.00**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	12	281,942,345.69	103,141,870.92
වන්දි අවිනිශ්චිත ගිණුම - අදියර I		105,282,015.60	106,775,362.83
වන්දි අවිනිශ්චිත ගිණුම - අදියර II		109,959,492.95	109,959,492.95
මුළු ජංගම නොවන වගකීම්		**497,183,854.24**	**319,876,726.70**
ජංගම වගකීම්			
වෙලඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	12	141,934,254.98	120,729,832.11
ගෙවිය යුතු එකතුකල අගය මත බදු		422,215.33	960,400.22
ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු		42,837.16	596,311.81
ගෙවිය යුතු රදවා ගැනීමේ බදු		76,003.30	120,140.15
මුළු ජංගම වගකීම්		**142,475,310.77**	**122,406,684.29**
මුළු වගකීම්		**639,659,165.01**	**442,283,410.99**
මුළු වගකීම් හා සංචිත		**5,409,893,505.05**	**5,091,887,997.93**

වගුව 3.10: 2019.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය			
විස්තරය	සටහන්	31.12.2019 රු.	31.12.2018 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් අතිරික්තය		1,291,126.73	121,635,246.06
ගැළපුම්			
ක්ෂය කිරීම්		11,785,496.22	7,126,430.12
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන		178,800,474.77	
මූල්‍ය ආදායම්			
මූල්‍ය වියදම්		6,090,781.90	3,117,689.33
ස්ථාවර වත්කම් බැහැර කිරීම			
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය		**197,967,879.62**	**131,879,365.51**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්			
වෙලඳ හා වෙනත් ගෙවිය යුතු දෑ අඩුවීම් හෝ වැඩිවීම		20,068,626.48	(17,780,775.92)
තැන්පතු හා අත්තිකාරම් අඩුවීම් හෝ වැඩිවීම		(15,165,165.49)	(4,995,949.50)
ලැබියයුතු පොළී අඩුවීම් හෝ වැඩිවීම		(18,238,045.56)	(29,982,748.28)
වෙලඳ සහ වෙනත් ලැබියයුතු අඩුවීම් හෝ වැඩිවීම		(56,976,582.11)	(17,475,755.18)
තොග අඩුවීම් හෝ වැඩිවීම්		(1,687,992.41)	(325,133.53)
ලැබියයුතු ආදායම් අඩුවීම් හෝ වැඩිවීම්			(258,353.69)
වන්දි ගෙවීම් අඩුවීම් හෝ වැඩිවීම්			647,582.63
පාරිතෝෂික ගෙවීම් අඩුවීම් හෝ වැඩිවීම්			11,899,472.92
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය කරන මුදල් ප්‍රවාහය		**125,968,720.52**	**(58,271,660.55)**
පාරිතෝෂික ගෙවීම්		(6,157,488.92)	
වන්දි ගෙවීම්		(1,493,347.23)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද ශු. මුදල් ප්‍රවාහය		**118,317,884.37**	
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
දෙපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම්		(7,791,338.07)	(16,276,120.22)
නොනිම් වැඩ ලියා හැරීම්		-	
ස්ථාවර තැනපතු සහ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන		(162,98,852.43)	(257,954,446.61)
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද ශු. මුදල් ප්‍රවාහය		**(170,590,190.50)**	**(274,230,566.83)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
ඉඩම් විකුණුම් ශු. වටිනාකම		116,201,727.53	99,804,773.24
මූල්‍ය පිරිවැය		(6,090,781.90)	(3,117,689.33)
පෙර වසරේ ගැලපීම්		(53,929,664.04)	20,578,570.51
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද ශු. මුදල් ප්‍රවාහය		**56,181,281.59**	**117,265,654.42**
මුදල් හා මුදල් සමාන දෑ හි ශු. වෙනස්වීම්		**4,445,925.97**	**(83,357,207.45)**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		**57,525,784.76**	**140,882,992.21**
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම		**61,971,710.73**	**57,525,784.76**

වගුව 3.11: 2019.12.31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය					
විස්තරය	රජයේ දායකත්වය රු.	භාණ්ඩාගාර ප්‍රධාන රු.	ප්‍රාග්ධන සංචිත රු.	සමුච්චිත අතිරික්තය රු.	එකතුව රු.
2018.01.01 දිනට ආරම්භක ශේෂය	**15,000,000.00**	**1,949,075,000.00**	**1,244,687,964.62**	**1,198,823,032.51**	**4,407,585,997.13**
වර්ෂය සඳහා අතිරික්තය	-	-	-	121,635,246.06	121,635,246.06
වෙනත් විස්තීරණ ආදායම්					
මුළු විස්තීරණ ආදායම්					
ඉඩම් විකුණුම් ශු. වටිනාකම (40%)			99,804,773.24		99,804,773.24
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය					
පෙර වර්ෂය සඳහා ගැලපීම්				20,578,570.51	20,578,570.51
අපහායනය ගැලපීම්					
2018.12.31 දිනට ශේෂය	**15,000,000.00**	**1,949,075,000.00**	**1,344,492,737.86**	**1,341,036,849.08**	**4,649,604,586.94**
සාධාරණ අගය ගැලපීම					
වර්ෂය සඳහා අතිරික්තය				1,291,126.73	1,291,126.73
වෙනත් විස්තීරණ ආදායම්					
මුළු විස්තීරණ ආදායම්					
ඉඩම් විකුණුම් ශු. වටිනාකම (40%)			116,201,727.53		116,201,727.53
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය			57,066,562.87		57,066,562.87
ස්ථාවර වත්කම්(පරිත්‍යාග සංචිත)					
පෙර වර්ෂය සඳහා ගැලපීම්				(53,929,664.04)	(53,929,664.04)
පාරිතෝෂික ප්‍රතිපාදන					
වෙනත් ගණුදෙනු(බදු කුළිය හා අධිභාර ලියා හැරීම)					
2019.12.31 දිනටශේෂය	**15,000,000.00**	**1,949,075,000.00**	**1,517,761,028.26**	**1,288,398,311.77**	**4,770,234,340.03**

3.5 අභ්‍යන්තර විගණන අංශය

3.5.1 විගණනය සඳහා බලය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභා පනත හා 1971 අංක 38 දරණ මුදල් පනත අනුව සැකසුන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභා මුදල් සංග්‍රහයේ 11 වන කොටසේ 02 වන වගන්තියේ අනු වගන්ති 01 - 03 අනුව විගණන සඳහා බලය ලැබී ඇත.

3.5.2 වසර තුළ ඉටු කරන ලද රාජකාරි

i. ප්‍රධාන ලිපිගොණුව සමග ඒ ඒල් අයදුම්පත් විගණනය කිරීම -1133
ii. පාරිතෝෂික ගෙවීම් සම්බන්ධ පරීක්ෂා -11
iii. වැටුප් පරීක්ෂාව -11
iv. වැඩ බැලීමේ දීමනා පරීක්ෂාව -02
v. සභාපතිතුමාගේ උපදෙස් අනුව වවුවර්පත් පූර්ව විගණනය කිරීම
vi. වන්දි හා පොලී ගෙවීම් පරීක්ෂා -55
vii. කැබ් රථ 2 ක බිල්පත් නිරාකරණය කිරීමේ පරීක්ෂාව
viii. මහනුවර දිස්ත්‍රික්කයේ හන්තාන වත්ත පිඹුරු අංක 581 කැබලි අංක 01 ඒ.එම්.එල්. බී.පොල්ගොල්ල මහතා වෙත පවරා දීම සම්බන්ධව පරීක්ෂාව
ix. ඔප්පු අංශය පරීක්ෂාව
x. දිස්ත්‍රික් කාර්යාල විගණනය

3.6 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

සභාව දිවයින පුරා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් පැතිරී පවතින දිස්ත්‍රික් කාර්යාල 20 කින් සමන්විත වේ. මෙම දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල කාර්යාල විසින් පහත කටයුතු සිදුකරනු ලබයි.

1. බස්නාහිර පළාත	කොළඹ	සෙන්ට්‍රල් ෆාමසි ගොඩනැගිල්ල, පාදුක්ක
	කළුතර	අංක 220, පරණ පාර, කළුතර
	ගම්පහ	ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ගොඩනැගිල්ල, කච්චේරිය, ගම්පහ
2. දකුණු පළාත	ගාල්ල	අංක. 27, රිච්මන්ඩ්කන්ද පාර, කළුවැල්ල, ගාල්ල
	මාතර	අංක 17/ඒ, ධර්මරත්න පාර, උයන්වත්ත, මාතර
	හම්බන්තොට	උසාවිය පාර, හම්බන්තොට
3. ඌව පළාත	මොණරාගල	ජනසවි ගාඩනැගිල්ල, කච්චේරි හංදිය, මොණරාගල
	බදුල්ල	අංක 195, කැප්පෙටිපොළ පාර, බදුල්ල
4. නැගෙනහිර පළාත	අම්පාර	කච්චේරිය, අම්පාර
	මඩකලපුව	කච්චේරිය, මඩකලපුව
5. උතුරුපළාත	යාපනය	කච්චේරිය, යාපනය
6. උතුරු මැද පළාත	අනුරාධපුර	කච්චේරිය, අනුරාධපුර

7. සබරගමුව පළාත	රත්නපුර	ෆාම් ගාඩින් වත්ත, නව නගරය, රත්නපුර
	ඇඹිලිපිටිය	12 බී, නොග ගබඩාව පාර,නව නගරය, ඇඹිලිපිටිය
	කෑගල්ල	කච්චේරිය, කෑගල්ල
8. වයඹ පළාත	පුත්තලම	පම්බල, කාකපල්ලිය, මාදම්පේ
	කුරුණෑගල	අංක 16, උතුරු වැව පාර, කුරුණෑගල
9. මධ්‍යම පළාත	නුවරඑළිය	I.R.D.Pගොඩනැගිල්ල,උඩුපුස්සැල්ලාවපාර,නුවරඑළිය
	මහනුවර	සිව්වන මහල, නව දිසත්‍රික් ලේකම් කාර්යාලය, මහ නුවර
	මාතලේ	කච්චේරිය, මාතලේ

- දිස්ත්‍රික් කාර්යාල පරිපාලනය හා අධීක්ෂණ කටයුතු.
- අමාත්‍යාංශය හා ප්‍රධාන කාර්යාලයේ පැවැත්වෙන සාකච්ඡා හා සම්මන්ත්‍රණ වලට සහභාගි වීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිපත් සභාව වෙනුවෙන් දිස්ත්‍රික්කයේ පැවැත්වෙන ජංගම සේවා වලට සහභාගි වීම
- කට්ටිකරුවන් තෝරා ගැනීමේ පරීක්ෂණ පැවැත්වීම
- රජයේ අවශ්‍යතාවය සඳහා ආයතන වලට හා පුද්ගලික ආයතන වලට ඉඩම් ලබා දීම.
- දිස්ත්‍රික් ඉඩම් ලේඛණ සැකසීම යාවත්කාලීන කිරීම හා ඊට අදාළ රාජකාරි කටයුතු
- දිස්ත්‍රික්කයේ ඉඩම් ලේඛණය, බැහැර කළ ඉඩම් ලේඛණය හා අනවසර ලේඛණය යාවත්කාලීන කිරීම.
- මාසිකව භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තා සකස් කර ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික්කයට අදාළ විගණන විමසීම් හා ලිපි සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය සමග සාකච්ඡාකර ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීම.
- දිස්ත්‍රික්කයට අදාළ ඉඩම් නඩු සඳහා අධිකරණයේ පෙනී සිටීම.
- තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ඊට අදාළ තොරතුරු, ප්‍රධාන කාර්යාලයේ තොරතුරු නිලධාරී වෙත නියමිත කාලයේදී ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන ඔප්පු ලබා දීමේ උත්සව සංවිධානය කිරීම.
- පවරාගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබා දීමට අදාළ කටයුතු
- රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම සම්බන්ධීකරණය හා පසු විපරම් කටයුතු.
- විධිමත් පරිදි අත්පත් කර නොගත් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- බෙදා දීමට සුදුසු ඉඩම් කොටස් මැණුම් කිරීම සඳහා පෙන්වා දී මිනින්දෝරුවන්ට සහය වීම.

ඇමුණුම්

A. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ **2019** දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒජිඑල්/ඒ/එල්ආර්සි/1/2019/16 මබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 නොවැම්බර් 12 දින

සභාපති,

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naoslgov.lk

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ). 1972 වර්ෂයේ කොමිෂන් සභාව පිහිට වූ දින සිට අත්පත් කරගත් ඉඩම්වලට අදාළ එම ඉඩම්වල අක්කර ගණන එක් එක් ඉඩම් පිහිටි ප්‍රදේශ, අත්පත් කරගනු ලැබුවේ කවරෙකුගෙන්ද,දැනට බුක්තිය පවරාදීම් පිළිබඳ විස්තර හා අදාළ ගැසට් නිවේදන සහ ඉඩම් බැහැර කිරීම්වලට අදාළ සියලුම විස්තර පිළිබඳ වූ සම්පූර්ණ විස්තර ඇතුළත් ලේඛනයක් ආයතනය විසින් නඩත්තු කර නොතිබූ අතර ඒ පිළිබඳ උපයෝගී ලියවිලි මඟින් පැහැදිලි කිරීමටද ආයතනය අපොහොසත් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.676,169,345ක් වූ පවරාගත් ඉඩම්වල පැවැත්ම හා අගය කිරීමේ නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 47 ඡේදය ප්‍රකාරව පෙර වර්ෂ වැරදි ඉදිරිපත් කරනු ලබන ගිණුම් කට්ටලයේ සංසන්ධනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගිව ගැලපිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල පෙර වර්ෂ ගැලපුම් ලෙස රු. 53,929,664 ක් වෙනම සමුච්චිත අතිරික්තයට ගලපා තිබුණද පෙර වර්ෂ වත්කම් හා වගකීම්වල සංසන්දනාත්මක අගයන්හි සංශෝධනය කරන ලද අගයන් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ලැබිය යුතු බදු කුලී උපලේඛනයේ දැක්වෙන බදුකරුවන් 21 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු බදු මුදල රු. 5,814,278 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු බදු මුදල රු.14,829,675 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. ලැබිය යුතු ආරම්භක හිඟ බදු මුදලක් නොමැතිව මෙම බදුකරුවන්ගෙන් ලැබිය යුතු බදු මුදල මෙලෙස රු.9,015,397 ක වෙනසක් සහිතව රු.14,829,675 ක් මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ඈ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පවරා ගන්නා ලද ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදලින් වර්ෂය තුළ ගෙවන ලද වන්දි මුදල රු.760,309ක් වුවද එය සදොස් ලෙස රු.1,493,347ක් වශයෙන් වන්දි අරමුදල් ගිණුමට බැරකර තිබුණි. එම නිසා වන්දි අරමුදල් ගිණුම රු.733,038 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කෙරුණි.එසේම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙකී වන්දි ගෙවීම්ද රු.733,038ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පදිංචිකරුවන්ගේ ඉඩම් මැන නියමානුකූල කරන අවස්ථාවේ ප්‍රතිපූර්ණය කිරීමට යටත්ව ඉඩම් කොටස් 100 ක් සඳහා මිනින්දෝරුවන් වෙත ගෙවා තිබුණු රු.28,364,819 ක මුදලින් ඉඩම් වල වට මැනුම් සඳහා වැය කර තිබුණු රු.2,139,169 ක මුදල වියදමක් ලෙස විස්තිර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඊ) 2019 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකු භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ශේෂය වූ රු.29,377,805 ක වටිනාකම වෙනුවට 2020 ජනවාරි 31 දිනට පැවති ආයෝජන වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට පැවති භාණ්ඩාගාර බිල්පත් වටිනාකම රු.610,652 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. එසේම සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම රු.565,442 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම නිසා වර්ෂයේ අතිරික්තයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහයට බලපෑමක් නොමැති රු.53,929,664 ක පෙර වර්ෂ ගැලපුම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරම් යටතේ මුදල් ගලායාම් ලෙස දක්වා තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ **සභාවේ** පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	**විස්තරය**
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මු.රෙ.101 සිට මු.රෙ.104	කෑගල්ල දිස්ත්‍රික් කැළණි වැලි සමාගමට භුක්තිය භාර දී ඇති ඉඩමකට ආරවුල් නඩුවක් තිබියදී එය නොසලකා කොමිෂන් සභාවෙන් ව්‍යාජ අඩු ආදායම් ඔප්පුවක් ලබාදීම හේතුවෙන් රු.1,371,750 ක මුදලක් සභාව විසින් අධිකරණයට ගෙවීම නිසා සිදුවූ මූල්‍යමය අලාභය රෙගුලාසි ප්‍රකාරව වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.
(ii) මු.රෙ.371 (5)	කාර්ය නිම කර දින 10 ක් ඇතුළත ලබාදුන් අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද අවස්ථා 22 කදී රු.483,060 ක් පියවීමට දින 18 සිට දින 149 දක්වා කාල පරාසයක් ප්‍රමාද කර තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදය 12 ඡේදයේ 12:5:4 හා 12:7 වගන්ති	සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස වැඩ බැලීම් කළ නිලධාරියා 2019 සැප්තැම්බර් සිට 2020 මැයි දක්වා වැඩ බලන දීමනාවට අමතරව දුරකථන, නිවාස, ඉන්ධන හා සංග්‍රහ දීමනා ලෙස රු.700,350 ක් ලබා ගෙන තිබුණි.
(ඇ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය	රාජ්‍ය ව්‍යවසායන්හි අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රු.1,919,478,424 ක් ආයෝජනය කර තිබුණි.

(ඇ)	2015 ජූනි 17 දිනැති අංක PED 3/2015 රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 2 ඡේදය	වක්‍රලේඛය ප්‍රකාරව සභාවේ සභාපතිට සහ විධායක අධ්‍යක්ෂවරයාට නිවාස සහ සංග්‍රහ දීමනා ලැබීමට හිමිකමක් නොමැති වුවද වක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු.1,100,000 ක නිවාස සහ සංග්‍රහ දීමනා ලබාගෙන තිබුණි.
(ඉ)	2017 පෙබරවාරි 17 දිනැති කොමිෂන් සභා තීරණය (පත්‍රිකා අංක 9676)	කළුගල් ඉඩම් බදු දීමේදී, වර්ෂයක කාලයක් සඳහා බල පැවැත්වෙන පරිදි ලිඛිත බදු ගිවිසුම් ලබා දිය යුතු බවත්, එය මධ්‍යම පරිසර අධිකාරිය සහ භූ විද්‍යා හා පතල් කාර්යාංශය යන ආයතන වල නිර්දේශ මත කළ යුතු වුවත් ඉහත ආයතන වල නිර්දේශ සහ ලිඛිත බදු ගිවිසුම් නොමැතිව කළුගල් ඉඩම් ලබා දී තිබුණි.
(ඊ)	2018 අගෝස්තු 18 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ	ඉඩම් විධිමත්ව ලැයිස්තුගත කිරීම, ලිපි ලේඛනවල ඇති අඩුපාඩු නිසා අමාත්‍යාංශයේ සෘජු මැදිහත් වීම මත හඳුනානොගත් ණයගැනි ශේෂ ලියා හැරීම, අයෝජන පවත්වා ගැනීම සඳහා වූ අනුමැතීන් සහ මොණරකැලේවත්තේ අක්කර 280 ක් අනුමැතියකින් තොරව බදු දී එම බදු මුදල් අයකර නොතිබීම ආදී කරුණු සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ ශ්‍රී කාලි අම්මාන් කෝවිලට බදු දී තිබූ අක්කර 04 රූඩ් 02 ක ඉඩම් ප්‍රමාණයකට වර්ෂ 31 ක් සඳහා අනවසර භුක්තියට අදාළ පරිහරණ ගාස්තු හා 2009 වසරේ සිට අයවිය යුතු බදු මුදල් ඇතුළුව රු. 3,817,066 ක මුදලක්ද කෑගල්ල දිස්ත්‍රික්කයේ බදු ගිවිසුමකට එළඹීමෙන් තොරව ප්‍රිනිපුර ළමා නිවාසයට බදු දී තිබූ අක්කර 75 කට අයවිය යුතු රු.3,141,521 ක මුදලක්ද අයකර ගැනීමට සහාව කටයුතු කර නොතිබුණි.

(ආ) බදු ගිවිසුමට එළඹීමෙන් තොරව හෝමාගම ප්‍රදේශයේ ලේලන්ඩ් වත්තෙහි අක්කර 6 ක බිම් ප්‍රමාණයක් සහ ටෙම්පල්බර්ග් වත්ත ඉඩමෙහි පර්චස් 80 ක් පිළිවෙලින් 2005 හා 2003 වර්ෂවලදී පෞද්ගලික සමාගම් දෙකකට බදු දී තිබුණි. මේ සඳහා වර්තමාන තක්සේරුවෙන් සියයට 6 ක ප්‍රතිශතයක් අයකිරීම සහාවේ සාමාන්‍ය ක්‍රමවේදය වුවද සියයට 4 බැගින් අයකිරීම නිසා පිලිවෙලින් රු.17,200,000 ක හා රු.400,000 ක ආදායමක් සහාවට අහිමි වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට පිලිවෙලින් රු. 11,203,288 ක හා රු.2,940,581 ක බදු මුදල්ද සහාවට මෙතෙක් ගෙවා නොතිබුණි.

(ඇ) 2002 වසරේ සිට 2004 වසර දක්වා සහාව ව්‍යාපෘති සඳහා ඉඩම් බදු දීමේ ක්‍රමවේදයට පටහැනිව ඉඩම්වල බුක්තිය පවරා දීමට කටයුතු කර තිබීම නිසා 2004 වර්ෂයේ කැබිනට් පත්‍රිකාවක් මඟින් එවැනි බදුදීම් තහනම් කර තිබුණි. මෙම ඉඩම්වලින් භුක්තියට පවරාදෙන ලද සහ භුක්තියට පවරා නොදෙන ලද වෙනමම හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. භුක්තියට පවරා දෙන ලද ඉඩම් ලෙස විගණනය හඳුනාගත් ඉඩම් අක්කර 760 යි පර්චස් 31 ක් ආපසු කොමිසමට භාරදී නොතිබුණි. භුක්තිය භාර නොදුන් අක්කර 1689 ක් සඳහා ලබාදී තිබූ අත්තිකාරම් මුදල් එම ඉල්ලුම්කරුවන්ට ආපසු ලබාදීමට කටයුතු කර නොතිබුණු අතර මෙම ඉඩම් පිළිබඳ පසු විපරම් කටයුතුද සිදුකර නොතිබුණි.

(ඈ) ගාල්ල දිස්ත්‍රික්කයේ මහහේන්තැන්න වත්ත ඉඩමේ අක්කර 10 ක ප්‍රමාණයක් නිවාස තනාගැනීම සඳහා ඇල්පිටිය ඉහළ ප්‍රදේශයේ සමාජ සුභසාධන සමිතියක් වෙත අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් තොරව ලබා දී ඉඩමේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සියයට 10 ක වර්ෂික පොලියට මාස 6 කින් ආපසු ගෙවීමේ පදනම මත 2019 මාර්තු මස රු.1,000,000 ක මුදලක් සහාව විසින් ලබාදී තිබුණි. එසේ වුවද නිවාස සංවර්ධන ව්‍යාපෘතිය මෙතෙක් ක්‍රියාත්මක වී නොතිබුණු අතර මුදල හෝ පොලිය අයකර ගැනීමට සහාව මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඉ) හන්තාන වත්ත නැමැති ඉඩමෙන් අක්කර 859 රූඩ් 02 පර්චස් 09 ක ප්‍රමාණයක් 1982 වර්ෂයේ ගැසට් පත්‍රයකින් එහි කළමනාකරණයට සහ කෘෂිකාර්මික කටයුතු සඳහා පමණක් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පවරා දී තිබුණි. එසේ වුවත් එයට පටහැනිව එම ඉඩමෙන් අක්කර 20 රූඩ් 2 පර්චස් 16 ක් රු.300,000 ක වාර්ෂික බදු මුදලකට හෝටල් ව්‍යාපෘතියකට බදු දී තිබුණු අතර අක්කර 29 පර්චස් 10 ක ඉඩම් කොටසක් රු.1,395,000 කට අගය කර සභාවේ අනුමැතිය නොමැතිව පුද්ගලයන් දෙදෙනෙකුට පවරා දී තිබුණි.

(ඊ) උලපනේ කර්මාන්තපුරයේ ඇති අක්කර 5 පර්චස් 20 ක ඉඩමක් පෞද්ගලික සමාගමකට බදු දී තිබුණු අතර මෙම ඉඩම සඳහා 2009 වසරේ සිට 2019 ජුනි දක්වා රු.1,722,121 ක බදු මුදලක් එම සමාගමෙන් අයවිය යුතුව තිබුණි. එසේම එම බදු දේපළ ඇපයට තබා මෙකී සමාගම සම්පත් බැංකුවෙන් ලබා ගත් ණය නොගෙවීම මත දේපළ වෙන්දේසියේ විකුණා දැමීමට තීරණය කළ බව සභාවට 2016 අප්‍රේල් මස දන්වා තිබුණද ඒ සම්බන්ධයෙන් බැංකුව සමඟ සාකච්ඡා කර ඉඩම නිරවුල් කර ගැනීමට සහ හිඟ බදු මුදල් අයකර ගැනීමට සභාව මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(උ) උලපනේ කර්මාන්තපුරයේ පිහිටුවා ඇති ආයතන 4 ක් සඳහා බදු දී තිබුණු රූඩ් 4 ක ඉඩම් සඳහා බදු ගිවිසුම් අත්පත් කර නොතිබුණි. ඒ අනුව 2008 වර්ෂයේ සිට අයවිය යුතු බදු මුදල් අයකරගෙන නොතිබුණු අතර බදු ගිවිසුමක් නොමැති නිසා අයවිය යුතු බදු මුදල් ගණනය කිරීමටද නොහැකි වී තිබුණි.

(ඌ) සභාවේ ඉඩම් මැනුම් කර නියමානුකූල කරන අවස්ථාවේ ප්‍රතිපූර්ණ කිරීමට යටත්ව ඉඩම් මැනුම් කර තිබුණු බලයලත් මිනින්දෝරුවන් හට රු.28,364,819 ක් ගෙවා තිබුණි. ආයතනයේ කඩිනම් ඔප්පු ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වී තිබියදීත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙයින් රු.2,886,048 ක් පමණක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. ඒ අනුව ඉතිරි මුදල සභාවට ප්‍රතිපූර්ණ කර ගැනීමට වසර 30 ක් පමණ කාලයක් ගත වන බව හා ඔප්පු ලබාදෙන අවස්ථාවේදී ඉඩම් මැනුම් කර ප්‍රතිපූර්ණය කර ගත්තේ නම් මෙවන් විශාල මුදලක් ආයතනයට දැරීමට සිදු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඒ) ඉඩම් බදු මුදල් අත්තිකාරම් ලෙස බදු ගැනුම්කරුවන් 270 ක ගෙන් ලබාගෙන තිබුණු රු.14,080,850ක ඉඩම් බදුකුලී අත්තිකාරම් ශේෂයෙන් රු.10,225,000 ක් වර්ෂ 15 කට වැඩි කාලයක සිටද රු. 1,115,850ක් වර්ෂ 10 කට වැඩි කාලයක සිටද නිරවුල් කිරීමට තිබුණු නමුත් යෝජිත ඉඩම් නීත්‍යානුකූලව පවරා දීමට හෝ අත්තිකාරම් ආපසු ගෙවා බැරකමින් නිදහස් වීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඓ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රාජ්‍ය ආයතන 7 කින් ලැබිය යුතු රු.මිලියන 2,135 ක ණය ශේෂයන් වර්ෂ 30 ත් 10 ත් අතර කාලයක සිටද, ඉඩම් බදු දීම වෙනුවෙන් පුද්ගලයන් 8 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 2.3 ක් වර්ෂ 20 කට වැඩි කාලයක සිටද අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඔ) චතු සමාගම් වලින් පවරාගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි ගිණුමේ 2005 වර්ෂයේ සිට වසර 14 කට වැඩි රු.109,959,493 ක අචල ශේෂයක්ද ඉඩම් විකුණුම් අත්තිකාරම් ගිණුමේ වර්ෂ 10 කට වැඩි රු.10,387,992 ක ශේෂයක්ද නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙන එමින් තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති